**ඩී.එස්.එස්. මෙන්ඩිස් එදිරිව. සමුපකාර සංවර්ධන දෙපාර්තමෙන්තුව (වයඹ)**

RTIC Appeal (ලේඛනගත කාර්යපටිපාටිය)/ 1911/2020 (2020.10.05 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අධ්‍යක්ෂ-ජනරාල්:** ඩී. ජී. එම්. වී. හපුආරච්චි

**අභියාචක -** ඩී.එස්.එස්. මෙන්ඩිස්
**නොතිසි ලත් පාර්ශවය -** නම්කළ නිලධාරී, සමුපකාර සංවර්ධන දෙපාර්තමෙන්තුව (වයඹ)

**පෙනීසිටීම**
මෙය ලේඛනගත කාර්යපටිපාටිය හරහා විභාග කරන ලදී.

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2019.07.08 |
| තොරතුරු නිළධරයා තීරණය ලබා දුන් දිනය | ප්‍රතිචාරයක් නොමැත |
| නම් කල නිළධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2019.08.02 |
| නම් කල නිළධරයා තීරණය ලබා දුන් දිනය | ප්‍රතිචාරයක් නොමැත |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2019.09.05 |

**අභියාචනයට පසුබිම්වූ කරුණු:**

අභියාචක 2019.07.08 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදී.

> *2015 වර්ෂයේ සිට වයඹ පළාතේ සමුපකාර සමිතිවල සේවකයින්/නිලධාරීන් ලෙස පත් කරන ලද වයඹ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පිළිබඳව පහත සඳහන් තොරතුරු.*

*i. 2015 වර්ෂයේ සිට වයඹ පළාතේ සමුපකාර සමිතිවල සේවකයින්/නිලධාරීන් ලෙස පත් කරන ලද වයඹ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ නම් සහ තනතුරු.*

*ii. වයඹ පළාතේ සමූපකාර සමිතිවල සේවකයින්/නිලධාරීන් ලෙස වයඹ සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ව පත් කරන ලද තනතුර සහ එම තනතුර දැරීම සඳහා ඔවුන්ව අනයුක්ත කරන ලද සමූපකාර සමිතියේ නම.*

*iii. සමූපකාර සමිතිවල සේවකයන්/නිලධාරීන් ලෙස වයඹ සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ව පත්කළ දිනය හා ඔවුන්ගේ පත්වීම අවසන් වූ දිනය.*

*iv. වයඹ සමූපකාර සමිතිවල සේවකයන්/නිලධාරීන් ලෙස වයඹ සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ව පත්කරන ලද පත්වීම් ලිපිවල පිටපත්.*

තොරතුරු නිලධාරියා පනත ප්‍රකාරව නියමිත කාලය තුළ, පිළිතුරු සැපයීමට අපොහොසත් වූ බැවින් අභියාචක 2019.08.02 දිනැතිව නම්කළ නිලධරයා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ නිලධාරයාද පනත ප්‍රකාරව නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක 2019.09.05 දිනැතිව කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

**අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

රට තුළ COVID-19 හේතුවෙන් හටගෙන ඇති සෞඛ්‍ය තත්වය හේතුවෙන්, පුද්ගල ආශ්‍රය අවම කිරීම සඳහා, දැනට පුද්ගලික විභාග කිරීම් සඳහා දින නියම කොට ඇති අභියාචනා මුල් වාරයේ, ලේඛනගත කාර්යය පටිපාටිය යටතේ සලකා බලනු ලැබේ. ඒ අනුව මෙම අභියාචනය සඳහා, ගොනුවේ ඇති ලේඛන මත පදනම්ව කොමිෂන් සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව පහත නියෝගයන් නිකුත් කරන ලදී. ඉහත ක්‍රියාපටිපාටිය පසු කාලීනව වෙනස් වීමට ලක්විය හැකිය.

අභියාචනය සලකා බලන අවස්ථාවේදී කොමිෂන් සභාවට පෙනී ගියේ තොරතුරු නිලධාරියාගේ පිළිතුරු මඟින් පොදු අධිකාරිය අවශ්‍ය තොරතුරු ලබාදීමට උත්සහ දරා ඇති බවයි. තවද, වයඹ පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ලේකම්තුමිය සිය 2019.08.06 දිනැති ලිපිය මඟින් නම්කළ නිලධාරියාට යොමුකරන ලද අභියාචනය සම්බන්ධයෙන් ද ප්‍රතිචාර දක්වා ඇති බවයි. අභියාචකද පිටපත් කරමින් පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව, කුරුණෑගල වෙත යොමු කර ඇති ලිපියෙන් දන්වා ඇත්තේ ඒ සම්බන්ධයෙන් නිත්‍යානුකූලව ලබාදිය හැකි තොරතුරු පමණක් විධිමත්ව ලබා දෙන ලෙසත්, ඒ පිළිබඳව තවදුරටත් ගැටළුවක් පවතී නම් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිලිබඳ කොමිෂන් සභාව විමසා අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරන ලෙසත් ය. තවද 2019.08.23 දිනැතිව සහකාර ප්‍රධාන ලේකම් I (ආයතන)අභියාචක ද පිටපත් කරමින් වයඹ පළාත් සමූපකාර සංවර්ධන කොමසාරිස් වෙත ලිපියක් යොමුකර ඇත. එයින් දන්වා ඇත්තේ අභියාචකගේ තොරතුරු ඉල්ලීම හා අභියාචනය සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගන්න ලෙසයි.

තොරතුරු නිලධාරියා තොරතුරු ලබාදීම සඳහා ගොනු පරික්ෂා කිරීමට අභියාචක කැඳවා ඇති මුත් අභියාචක එයට එකඟ වී නොමැති හෙයිනුත් පොදු අධිකාරිය ඉහත සඳහන් කර ඇති ලිපිය මඟින් තොරතුරු ලබාදීමට උත්සහ කරන බව පෙනී යන හෙයිනුත් අභියාචනය පුද්ගලික වශයෙන් සලකා බැලීම වඩාත් උචිත බව කොමිෂන් සභාවේ තීරණය විය.

මීළඟ අභියාචනා විභාගය 2019.12.07 දිනට කල් තබන ලදී.

---

RTIC Appeal (ලේඛනගත කාර්යපටිපාටිය)/ 1911/2020 (2021.01.11 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල

**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා

**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අධ්‍යක්ෂ-ජනරාල්:** ඩී. ජී. එම්. වී. හපුආරච්චි

**අභියාචක** - ඩී.එස්.එස්. මෙන්ඩිස්
**නොතිසි ලත් පාර්ශවය** - නම්කළ නිලධාරී, සමුපකාර සංවර්ධන දෙපාර්තමෙන්තුව (වයඹ)

**පෙනීසිටීම**
මෙය ලේඛනගත කාර්යපටිපාටිය හරහා විභාග කරන ලදී.

**අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

රට තුළ COVID-19 හේතුවෙන් හටගෙන ඇති සෞඛ්‍ය තත්වය හේතුවෙන්, පුද්ගල ආශ්‍රය අවම කිරීම සඳහා, දැනට කොමිෂන් සභා රීතින්හි, රීති අංක 20 (ගාස්තු හා අභියාචනා කාර්යපටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) යටතේ පුද්ගලික විභාග කිරීම් සඳහා දින නියම කොට ඇති අභියාචනා මුල් වාරයේ, ලේඛනගත කාර්යය පටිපාටිය යටතේ සලකා බලනු ලැබේ. ඒ අනුව මෙම අභියාචනය ගොනුවේ ඇති ලේඛන මත පදනම්ව කොමිෂන් සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව පහත නියෝගයන් නිකුත් කරන ලදී. ඉහත ක්‍රියාපටිපාටිය පසු කාලීනව වෙනස් වීමට ලක්විය හැකිය.

රට තුල පවතින්නාවූ COVID-19 තත්වය හේතුවෙන් 2020.12.07 දිනට පුද්ගලික කාර්යපටිපාටිය ඔස්සේ විමසීමට තිබූ අභියාචනා කැඳවීම් වාරය නොතිබූ බැවින් මෙම අභියාචනය 2021.03.29 දින පුද්ගලික වශයෙන් විභාග කිරීමට කොමිෂන් සභාව මින් තීරණය කරනු ලැබේ.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යපටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.

---

RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම)/ 1911/2020 (2021.03.29 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අධ්‍යක්ෂ-ජනරාල්:** ඩී. ජී. එම්. වී. හපුආරච්චි

**අභියාචක** - ඩී.එස්.එස්. මෙන්ඩිස්
**නොතිසි ලත් පාර්ශවය** - නම්කළ නිලධාරී, සමුපකාර සංවර්ධන දෙපාර්තමෙන්තුව (වයඹ)

**පෙනීසිටීම**
අභියාචක - නොපැමිණි.
පොදු අධිකාරිය - සිසිර බණ්ඩාර (සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්)

**අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

රට තුළ COVID-19 හේතුවෙන් හටගෙන ඇති සෞඛ්‍ය තත්වය හේතුවෙන්, පුද්ගල ආශ්‍රය අවම කිරීම සඳහා, දැනට කොමිෂන් සභා රීතීන්හි, රීති අංක 20 (ගාස්තු හා අභියාචනා කාර්යපටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) යටතේ පුද්ගලික විභාග කිරීම් සඳහා දින නියම කොට ඇති අභියාචනා මුල් වාරයේ, ලේඛනගත කාර්යය පටිපාටිය යටතේ සලකා බලනු ලැබේ. ඒ අනුව මෙම අභියාචනය ගොනුවේ ඇති ලේඛන මත පදනම්ව කොමිෂන් සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව පහත නියෝගයන් නිකුත් කරන ලදී. ඉහත ක්‍රියාපටිපාටිය පසු කාලීනව වෙනස් වීමට ලක්විය හැකිය.

මෙහිදී පොදු අධිකාරිය විසින් කරුණු පැහැදිලි කරමින් දක්වා සිටියේ අභියාචක විසින් ඉල්ලුම් කර ඇති ආකාරයේ තොරතුරු අඩංගු ලේඛන පවත්වා නොගෙන යන බවත් ඊට හේතුව මෙම පත්වීම් කෙටි කාලීන පත්වීම් බවත්ය. කෙසේ නමුත් පත්වීම් ලිපි ලබා දෙන බව ද ඒ අනුව ලිපිගොනු ගණනාවක් පරික්ෂා කිරීමට සිදු වන බව ද දක්වා සිටින ලදී. වයඹ පළාත් සමුපාකාර සමිති කර්මාන්ත 100ක් ද,විවිධ සේවා සමුපකාර සමිති 33ක්ද, ණයසු සමුපකාර සමිති 1500ක් පමණ වයඹ පළාත තුල ක්‍රියාත්මක වන බව ද ඒ අනුව අභියාචක විසින් ඉල්ලුම් කල ඇති තොරතුරු වපසරිය පුළුල් බව ද දක්වන ලදී. මෙහිදී වැඩිදුරටත් තොරතුරු දක්වමින් පොදු අධිකාරිය විසින් පවසා සිටියේ නිශ්චිතවම අවශ්‍ය තොරතුරු දක්වා සිටින්නේ නම්, තොරතුරු ලබාදීම සිදුකල හැකි බව ය.

**නියෝගය:**

පොදු අධිකාරිය විසින් ඉදිරිපත් කල කරුණු දැක්වීම් අනුව පැහැදිලි වන්නේ අභියාචක විසින් ඉල්ලුම් කර ඇති තොරතුරු පරාසය ඉතාමත් පුළුල් බව ය. ඒ අනුව මෙම පරාසය පටු කිරීම තුලින් පොදු අධිකාරියට අභියාචක වෙත එම තොරතුරු වෙත ප්‍රවේශ වීමේ හැකියාව ලබා දිය හැකි බව කොමිෂන් සභාවේ පිළිගැනීමයි.

ඒ අනුව 2015 වර්ෂයේ සිට මේ දක්වා වයඹ පළාතේ ක්‍රියාත්මක වන විවිධ සේවා සමුපකාර සමිති 33 හා සම්බන්ධව, අභියාචක විසින් ඉල්ලුම් කල ඇති තොරතුරු මෙම නියෝගය ලැබී මාසයක කාලය තුල කොමිෂන් සභාවට ද පිටපත් සහිතව අභියාචක වෙත ලබා දෙන මෙන් මින් නියෝග කෙරේ. අභියාචක විසින් මෙම තොරතුරු හා සෑහීමකට පත් නොවන්නේ නම් මෙම තොරතුරු ඔහු වෙත ලැබී මාසයක කාලය තුල කොමිෂන් සභාව වෙත දන්වන මෙන් මින් අභියාචක වෙත අවධාරණය කරනු ලැබේ.

ඒ අනුව අභියාචනයේ කටයුතු මින් අවසන් කෙරේ.

සැ.යු. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතෙහි උපලේඛනයෙහි 7 (ආ) වගන්තිය ප්‍රකාරව, 2021.03.29 දින විභාගයට ගැනුණු අභියාචන විභාගයේ නියෝගය නැවත 2021.03.30 දින පැවති 193 වන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රැස්වීමේ දී සළකා බලා, තහවුරු කර, අනුමත කරන ලදී.

කොමිෂන් සභා රීතීන්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.

...........................................................
මහින්ද ගම්මම්පිල - සභාපති

.............................................................
එස්. ජී. පුංචිහේවා - කොමිෂන් සභා සාමාජික

...........................................................
රෝහිනී වල්ගම - කොමිෂන් සභා සාමාජිකා